# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 2013 අංක 25 දරන උප්පැන්න සහ මරණ ලියාපදිංචි කිරීමේ (සංශෝධන) පනත

---

**[සහතිකය සටහන් කළේ 2013 මැයි මස 08 වැනි දින]**

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2013 මැයි මස 10 වන දින **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ** II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැක.

**මිළ : රු. 2.50 යි.** **තැපැල් ගාස්තුව : රු. 5.00 යි.**

## 2013 අංක 25 දරන උප්පැන්න සහ මරණ ලියාපදිංචි කිරීමේ (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 2013 මැයි මස 08 වැනි දින]

එල්. ඩී.— ඕ. 17/2013.

### (110 වන අධිකාරය වූ) උප්පැන්න සහ මරණ ලියාපදිංචි කිරීමේ පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

**1.** මේ පනත 2013 අංක 25 දරන උප්පැන්න සහ මරණ ලියාපදිංචි කිරීමේ (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර, 2013 ජනවාරි මස 1 වන දින සිට ක්‍රියාත්මක වන ලෙස සලකනු ලැබිය යුතු ය.

කෙටි නාමය සහ ක්‍රියාත්මක වීමේ දිනය.

**2.** (මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) (110 වන අධිකාරය වූ) උප්පැන්න සහ මරණ ලියාපදිංචි කිරීමේ පනතේ 24 වන වගන්තිය, එම වගන්තියේ (2) වන උපවගන්තියේ "උපත සිදුවී මාස දොළහක් ඇතුළත දී" යන වචනවල සිට "ප්‍රකාශකයා විසින් සැපයිය යුතු ය." යන වචන දක්වා වූ සියලු වචන වෙනුවට, "එවැනි සෑම ප්‍රකාශයක් සමඟම ප්‍රකාශකයා විසින් ගෙවිය යුතු රුපියල් පනහක ගාස්තුවක් හෝ අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන වෙනත් යම් මුදලක් ඉදිරිපත් කරනු ලැබිය යුතු ය." යන වචන ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

(110 වන අධිකාරය වූ) උප්පැන්න සහ මරණ ලියාපදිංචි කිරීමේ පනතේ 24 වන වගන්තිය සංශෝධනය කිරීම.

**3.** ප්‍රධාන ප්‍රඥප්තියේ 27 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (ආ) ඡේදයේ "එම ඉල්ලීම කරනු ලබන්නේ" යන වචනවල සිට "එම ඉල්ලුම් පත්‍රයෙහි අලවා තිබිය යුතු ය." යන වචන දක්වා වූ සියලු වචන වෙනුවට, "එම ඉල්ලුම්කරු විසින් රුපියල් පනහක ගාස්තුවක් හෝ අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන වෙනත් යම් මුදලක් සමඟ එම ඉල්ලුම් පත්‍රය ඉදිරිපත් කළ යුතු ය." යන වචන ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 27 වන වගන්තිය සංශෝධනය කිරීම.

**4.** ප්‍රධාන ප්‍රඥප්තියේ 27අ වගන්තියේ (2) වන උපවගන්තියේ "ඉල්ලුම්කරු විසින් සපයනු ලබන රුපියල් පහක මුද්දරයක් අලවා තිබිය යුතු ය." යන වචන වෙනුවට, "ඉල්ලුම්කරු විසින් රුපියල් පනහක ගාස්තුවක් ගෙවිය යුතු ය." යන වචන ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 27අ වගන්තිය සංශෝධනය කිරීම.

2 —PL 007079 -3,340 (2013/03)

ප්‍රධාන ප්‍රඥප්තියේ 28 වන වගන්තිය සංශෝධනය කිරීම.

**5.** ප්‍රධාන ප්‍රඥප්තියේ 28 වන වගන්තියේ (2) වන උපවගන්තිය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

> "(2) (1) වන උපවගන්තිය යටතේ කරනු ලබන සෑම ඉල්ලීමක් සමගම රුපියල් පහක ගාස්තුවක් හෝ අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන වෙනත් යම් මුදලක් ද ඉදිරිපත් කළ යුතු අතර එකී මුදල ඉල්ලුම්කරු විසින් ගෙවනු ලැබිය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 36 වන වගන්තිය සංශෝධනය කිරීම.

**6.** ප්‍රධාන ප්‍රඥප්තියේ 36 වන වගන්තියේ (2) වන උපවගන්තියේ "මරණය සිදුවී මාස දොළහක් ඇතුළත දී" යන වචනවල සිට "ප්‍රකාශකයා විසින් සැපයිය යුතු ය." යන වචන දක්වා වූ වචන වෙනුවට, "එවැනි සෑම ප්‍රකාශයක් සමගම රුපියල් පනහක ගාස්තුවක් හෝ අමාත්‍යවරයා විසින් නියම කරනු ලැබිය හැකි වෙනත් මුදලක් ඉදිරිපත් කළ යුතු අතර, එකී මුදල ප්‍රකාශකයා විසින් ගෙවනු ලැබිය යුතු ය." යන වචන ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 52 වන වගන්තිය සංශෝධනය කිරීම.

**7.** ප්‍රධාන ප්‍රඥප්තියේ 52 වන වගන්තියේ (3) වන උපවගන්තියේ (ඇ) ඡේදයේ "රුපියලක මුද්දරයක් ඇලවිය යුතු ය;" යන වචන වෙනුවට, "රුපියල් පනහක ගාස්තුවක් හෝ අමාත්‍යවරයා විසින් නියම කරනු ලැබිය හැකි වෙනත් මුදලක් ඉදිරිපත් කළ යුතු ය;" යන වචන ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 61 වන වගන්තිය සංශෝධනය කිරීම.

**8.** ප්‍රධාන ප්‍රඥප්තියේ 61 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

(1) එම වගන්තියේ (1) වන උපවගන්තියේ "තව ද ඒ සඳහා මෙම ආඥාපනත යටතේ ගෙවිය යුතු මුද්දර ගාස්තුව" යන සියලු වචනවල සිට "වෙළඳ නියෝජිතවරයාට එකී මුදල ගෙවිය යුතු ය." යන වචන දක්වා වූ වචන වෙනුවට, "තව ද, ඒ සඳහා මෙම පනත යටතේ එම ප්‍රකාශය සම්බන්ධයෙන් ගෙවිය යුතු මුදල රෙජිස්ට්‍රාර්-ජනරාල්වරයාට හෝ අදාළ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරයා වෙත එවිය යුතු ය. නැතහොත් ඔහු විසින් එම ප්‍රකාශය සිදු කරනු ලැබුවේ යම් තානාපතිවරයකු හෝ වෙළෙඳ නියෝජිතයකු ඉදිරිපිට දී නම්, එම තානාපතිවරයාට හෝ වෙළෙඳ නියෝජිතවරයාට එකී මුදල ගෙවිය යුතු ය." යන වචන ආදේශ කිරීමෙන්;

(2) එම වගන්තියේ (2) වන උපවගන්තියේ "නියම වටිනාකම ඇති මුද්දරයක් අලවා සටහන් කරනු ලැබූ කඩදාසියක" යන වචන වෙනුවට "නියම වටිනාකම ගෙවීම පිළිබඳ ලදුපතක් සමග සටහන් කරනු ලැබූ කඩදාසියක" යන වචන ආදේශ කිරීමෙන්.".

**9.** 2013 ජනවාරි මස 1 වන දිනයෙන් ආරම්භව කථානායකවරයාගේ සහතිකය ඔහුගේ අත්සන ඇතිව සටහන් කරනු ලබන්නා වූ දිනයෙන් අවසන්වන කාලය දක්වා යම් ගාස්තුවක් අයකිරීම සඳහා හෝ එකතු කිරීම සඳහා මේ පනත මගින් බලය දී ඇති යම් කාර්යයක් සඳහා රෙජිස්ට්‍රාර්-ජනරාල්වරයා විසින් හෝ ඔහු වෙනුවෙන් නැතහොත් මේ පනත යටතේ බලය පවරන ලද යම් තැනැත්තකු විසින් අයකරනු ලබන හෝ එකතු කරනු ලබන යම් ගාස්තු රෙජිස්ට්‍රාර්-ජනරාල්වරයා විසින් හෝ මේ පනත යටතේ බලය පවරන ලද වෙනත් යම් තැනැත්තකු විසින් වලංගු ලෙස අය කරනු ලැබ හෝ එකතු කර ඇති ලෙස සලකනු ලැබිය යුතු යː වලංගුවීම.

එසේ වුව ද, ඉහත කී විධිවිධාන, ඉහත කී කාලසීමාව තුළ දී අයකරනු ලබන හෝ එකතු කරනු ලබන ගාස්තු සම්බන්ධයෙන් යම් අධිකරණයක් විසින් කරනු ලබන තීරණයකට හෝ නියමයකට නැතිනම් යම් අධිකරණයක විභාග වෙමින් පවත්නා නඩු කටයුතු සඳහා බලනොපෑ යුතු ය.

**10.** මෙම පනතේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය. අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.